ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

# 1979 අංක 48 දරන

# ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූලි මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ජූලි මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : රු. 1.20 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූලි මස 20 වන දින]

එල්.ඩී.—ඕ. 39/79.

**ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදී ක්‍රියා වැළැක්වීම සඳහා ද ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් පුද්ගලයකුගේ, පුද්ගල කණ්ඩායමක, සමිතියක, සංවිධානයක නැතහොත් පුද්ගල මණ්ඩලයක නීති විරෝධී ක්‍රියා වැළැක්වීම සඳහා ද ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ කරුණු සඳහා ද තාවකාලික විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

මිනිසුන් නිදහස් ව සිටින්නේත් ආයතන නිදහස් ව පවතින්නේත් නීතියේ පාලනය කෙරෙහි දක්වනු ලබන ගෞරවය මත නිදහස පදනම් කර ගනු ලබන්නා වූ විට පමණක් බවට සහ දුක්ගැනවිලි වලට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වූ ක්‍රම මගින් පිළියම් සලසා ගත යුතු බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව තවදුරටත් සහතික වන හෙයින් ද: පූර්විකාව.

ශ්‍රී ලංකාව තුළ ආණ්ඩුව වෙනස් කිරීම සාක්ෂාත් කර ගැනීමේ මාර්ගයක් ලෙස හෝ ආධාරකයක් ලෙස හෝ මැරවර බලය යොදා ගැනීම නැතහොත් අපරාධ සිදු කිරීම ගුරු කොට ගන්නා වූ ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්, පළාත් පාලන ආයතනයන්හි සභික යන් සහ පොලිස් නිලධරයන් මරණයට පත් කිරීමේ සහ මරණ බවට තර්ජනය කිරීමේ ක්‍රියා ද වෙනත් නීති ගරුක අහිංසක පුර වැසියන් මරණයට පත් කිරීමේ සහ මරණ බවට තර්ජනය කිරීමේ ක්‍රියා මෙන්ම ඒ ක්‍රියා පිළිබඳ සාක්ෂිකරුවන් මරණයට පත් කිරීමේ සහ මරණ බවට තර්ජනය කිරීමේ ක්‍රියා ද, සන්නද්ධ කොල්ල කෑම්, රාජ්‍ය දේපළවලට අලාභ කිරීම් සහ ඒකාන්ත බලහත්කාරකම්, භය ගැන්වීම සහ සාහසික ක්‍රියා නැතහොත් එසේ කරන බවට තර්ජනය කිරීම ඇතුළත් වෙනත් ත්‍රස්තවාදී ක්‍රියා කරනු ලබන්නා වූ ද පිරිස් හෝ පුද්ගල කණ්ඩායම් හෝ සමිති ශ්‍රී ලංකාවේ මහජන සාමයට උපද්‍රවයක්ව පවතින හෙයින් ද:

ත්‍රස්තවාදී ක්‍රියා සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට වෙනත් ප්‍රජාතන්ත්‍රවාදී රටවල් විශේෂ නීති පනවා ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක හෝ දිනවල, එය, එහි විධිවිධාන සියල්ලම හෝ ඉන් යම් විධිවිධානයක් හෝ සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

## I වන කොටස

### වැරදි

**2.** (1) (අ) දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන යටතේ මරණීය දණ්ඩනයෙන් හෝ අවුරුදු හතකට නොඅඩු කාලයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඬුවම් කළ හැකි ක්‍රියාවක් වන යම් නිශ්චිත මේ පනත යටතේ වැරදි සහ දණ්ඩන.

තැනැත්තකුගේ මරණය සිදු කරන්නා වූ හෝ යම් නිශ්චිත තැනැත්තකු අපහරණය කරන්නා වූ නැතහොත් පැහැර ගෙන යන්නා වූ හෝ වෙනත් යම් පහර දීමක් හෝ එවැනි යම් තැනැත්තකුට සිදු කරන්නා වූ; හෝ

(ආ) දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන යටතේ මරණීය දණ්ඩනයෙන් හෝ අවුරුදු හතකට නොඅඩු කාලයක බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි ක්‍රියාවක් වන, මේ පනත යටතේ යම් වරද කට සාක්ෂිකරුවකු වන යම් තැනැත්තකුගේ මරණය සිදු කරන්නා වූ හෝ ඒ තැනැත්තා අපහරණය කරන්නා වූ නැතහොත් පැහැර ගෙන යන්නා වූ හෝ වෙනත් යම් පහර දීමක් හෝ එවැනි යම් තැනැත්තකුට සිදු කරන්නා වූ; හෝ

(ඇ) නිශ්චිත තැනැත්තකුට හෝ (ආ) ඡේදයෙහි සඳහන් සාක්ෂිකරුවකුට සාපරාධ භයගැන්වීමක් සිදු කරන්නා වූ; හෝ

(ඈ) ආණ්ඩුවේ හෝ යම් දෙපාර්තමේන්තුවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, රාජ්‍ය සංස්ථාවක හෝ යම් බැංකුවක, සමුපකාර සංගමයක හෝ සමුපකාර සමිතියක දේපළ කොල්ලකෑමේ වරද සිදු කරන්නා වූ; හෝ

(ඉ) ආණ්ඩුවේ හෝ යම් දෙපාර්තමේන්තුවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, රාජ්‍ය සංස්ථාවක හෝ යම් බැංකුවක, සමුපකාර සංගමයක හෝ සමුපකාර සමිතියක දේපළකට හෝ වෙනත් යම් රජයේ දේපළකට හෝ අනර්ථය කිරීමේ වරද සිදු කරන්නා වූ; හෝ

(ඊ) යම් තුවක්කු, පීඩාකාරී ආයුධ, වෙඩි බෙහෙත් හෝ පුපුරණ ද්‍රව්‍ය නැතහොත් පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමෙහි ලා පාවිච්චි කරනු ලබන නැතහොත් පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන යම් භාණ්ඩයක් හෝ දෙයක් හෝ නීත්‍යානුකූල බලයක් නොමැතිව ආනයනය කරන්නා වූ, නිෂ්පාදනය කරන්නා වූ හෝ එකතු කරන්නා වූ; හෝ

(උ) යම් ආරක්ෂිත ප්‍රදේශයක් තුළ, නීත්‍යානුකූල බලයක් නොමැතිව, යම් තුවක්කු හෝ යම් පීඩාකාරී ආයුධ, වෙඩි බෙහෙත් හෝ පුපුරණ ද්‍රව්‍ය නැතහොත් පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමෙහි ලා පාවිච්චි කරනු ලබන නැතහොත් පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන යම් භාණ්ඩයක් හෝ දෙයක් සන්තකව සිටින්නා වූ; හෝ

(ඌ) කියනු ලබන නැතහොත් කියවීමට අදහස් කරනු ලැබූ වචන මගින් හෝ සංඥා මගින් හෝ දෘශ්‍ය නියෝජන මගින් හෝ අන්‍යාකාරයෙන් සාහසික ක්‍රියා හෝ විවිධ ජන කොටස් නැතහොත් වර්ගීය

හෝ ආගමික කණ්ඩායම් අතර ආගමික, වර්ගීය නැතහොත් ජාතිවාදී අසංගතිය නැතහොත් දුර්චේතනික හෝ එදිරිවාදී හැඟීම් ඇති වීමට සලස්වන්නා වූ හෝ ඇතිවීමට සැලැස්වීමට අදහස් කරන්නා වූ; හෝ

(එ) යම් මහා මාර්ගයක, වීථියක, පාරක හෝ වෙනත් යම් පොදු ස්ථානයක නැතහොත් යම් මහා මාර්ගයක්, වීථියක්, පාරක් හෝ වෙනත් පොදු ස්ථානයක් මත නැතහොත් යම් මහා මාර්ගයකට, වීථියකට, පාරකට හෝ වෙනත් පොදු ස්ථානයකට යාබදව පිහිටි යම් පුවරුවක හෝ වෙනත් සවි කිරීමක දැක්වෙන වචන, නිරූපණ හෝ අකුරු කිසිවක් නීත්‍යානුකූල බලයක් නොමැතිව මකන්නා වූ, විච්ඡේදනය කරන්නා වූ, විරූප කරන්නා වූ හෝ වෙනත් අන්දමකින් අයථා ලෙස යම් දෙයක් කරන්නා වූ; හෝ

(ඒ) ප්‍රකාශිත තැනැත්තකුට, හෝ මේ පනත යටතේ වරදක් කර ඇතැයි දැනගන්නට ඇත්තේ හෝ විශ්වාස කිරීමට හේතු තිබෙන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද එවැනි තැනැත්තකුට හෝ රැකවරණ සපයන්නා වූ හෝ එවැනි තැනැත්තකු සඟවන්නා වූ හෝ එවැනි තැනැත්තකු අල්ලා ගැනීම වෙනත් යම් ආකාරයකින් වළක්වන්නා වූ නැතහොත් අල්ලා ගැනීමට බාධා කරන්නා වූ හෝ මැදිහත් වන්නා වූ

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) යම් තැනැත්තකු—

(i) (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදයෙහි සඳහන් වරදකට වරදකරු කරනු ලැබූ විට ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් විය යුතු ය, තවද

(ii) (1) වන උපවගන්තියේ (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ) හෝ (ඒ) ඡේදයෙහි සඳහන් වරදකට වරදකරු කරනු ලැබූ විට අවුරුදු පහකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

(3) මේ වගන්තියෙහි—

(i) "ප්‍රකාශිත තැනැත්තා" යන්නෙන්, මේ පනත යටතේ යම් වරදක් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය තැනැත්තකු යයි ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ප්‍රකාශනයක් මගින් පොලිස්පතිවරයා විසින් ප්‍රකාශිත යම් තැනැත්තෙක් අදහස් වේ; තව ද

(ii) "ආරක්ෂිත ප්‍රදේශය" යන්නෙන්, යම් නීති විරෝධී ක්‍රියාකාරකමක හේතුවෙන් යම් ප්‍රදේශයක සංවිධානාත්මකව කරනු ලබන සාහසික ක්‍රියා ඇති වෙතැයි සාධාරණ බියක්

ඇති බවට අමාත්‍යවරයා සෑහීමට පත්වන්නේ නම්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ආරක්ෂිත ප්‍රදේශයක් බවට අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරනු ලබන ඒ ප්‍රදේශය අදහස් වේ.

වරද කිරීම පිණිස සූදානම් වීම, අනුබල දීම, කුමන්ත්‍රණය කිරීම හෝ පෙළඹවීම සඳහා දණ්ඩනය.

3. (අ) වරදක් කිරීමට සූදානම් වීමක් වශයෙන් යම් ක්‍රියාවක් කරන්නා වූ; හෝ

(ආ) වරදක් කිරීමට අනුබල දෙන්නා වූ, කුමන්ත්‍රණය කරන්නා වූ, තැත් කරන්නා වූ, අනුශාසනය කරන්නා වූ නැතහොත් පොළඹවන්නා වූ; හෝ

(ඇ) දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන යටතේ මරණීය දණ්ඩනයෙන් හෝ අවුරුදු හතකට නොඅඩු කාලයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඬුවම් කළ හැකි ක්‍රියාවක් වන මේ පනත යටතේ යම් වරදක් කිරීමේ දී යම් තැනැත්තකුගේ මරණය සිදු කරන්නා වූ හෝ කවර වූ හෝ තැනැත්තකුට පහර දෙන්නා වූ,

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට (අ) හෝ (ආ) ඡේදයෙහි සඳහන් වරදක් වන අවස්ථාවක අවුරුදු පහකට අඩු නොවූ ද අවුරුදු විස්සක් නොඉක්ම වන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ (ඇ) ඡේදයෙහි සඳහන් වරදක් වන අවස්ථාවක ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඔහු යටත් විය යුතු ය.

දේපළ ජනරජය සන්තක කිරීම.

4. 2 වන වගන්තිය හෝ 3 වන වගන්තිය හෝ යටතේ යම් වරදකට යම් අධිකරණයක් විසින් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක, ඒ වරද සඳහා අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් දණ්ඩනයකට අමතරව—

(අ) ඒ තැනැත්තාගේ සියලු චංචල හා නිශ්චල දේපළ, ඒ වරද කරු කිරීමේ හේතුවෙන් ජනරජය සන්තක වූ ලෙස සැලකිය යුතු ය; තව ද

(ආ) මේ කොටස බලාත්මක වන දිනයෙන් පසුව ඒ දේපළ සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් කරන ලද යම් අන්සතු කිරීමක් හෝ වෙනත් බැහැර කිරීමක් අවලංගු සහ බල රහිත ව පැවති ලෙස ද අවලංගු හා බල රහිත වන ලෙස ද සැලකිය යුතු ය.

ඇතැම් තොරතුරු දීම පැහැර හැරීම සම්බන්ධයෙන් දණ්ඩනය.

5. (අ) යම් තැනැත්තකු—

(i) මේ පනත යටතේ වරදක් සිදු කර ඇති බව, හෝ

(ii) මේ පනත යටතේ වරදක් සිදු කිරීමට සූදානම් වන බව හෝ තැත් කරන බව, හෝ

දැනුවත්ව හෝ ඒ බව විශ්වාස කිරීමට සෑහෙන හේතු ඇතිව එය පොලිස් නිලධරයකුට දන්වා සිටීම පැහැර හරින්නා වූ; හෝ

(ආ) මේ පනත යටතේ වරදක් කර ඇත්තා වූ හෝ වරදක් කිරීමට සූදානම් වන්නා වූ නැතහොත් වරදක් කිරීමට තැත් කරන්නා වූ යම් තැනැත්තකුගේ ගමන් බිමන් වලට හෝ ගැවසෙන තැන්වලට හෝ අදාළ යම් තොරතුරු තම සන්තකයෙහි ඇතිව, ඒ තොරතුරු පොලිස් නිලධරයකුට දන්වා සිටීම පැහැර හරින්නා වූ; හෝ

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට අවුරුදු හතක් නොඉක්මවන්නා වූ කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය යුතු ය.

## II වන කොටස

## වැරදි විමර්ශනය කිරීම

6. (1) පොලිස් අධිකාරී නිලයට පහළ නොවන නිලයක් දරන්නා වූ යම් පොලිස් නිලධරයකු හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා ලියවිල්ලකින් බලය දෙනු ලැබූ උප පොලිස් පරීක්ෂක නිලයට පහළ නොවන නිලයක් දරන්නා වූ වෙනත් යම් පොලිස් නිලධරයකු හෝ විසින්, වරෙන්තුවක් නොමැතිව සහ සහාය ඇතිව හෝ නැතිව, එමෙන් ම වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, යම් නීති විරෝධී ක්‍රියාකාරකමකට සම්බන්ධ හෝ ප්‍රවේදීතාවක් දක්වන හෝ සම්බන්ධ යයි නැතහොත් ප්‍රවේදීතාවක් දක්වන්නේ යයි යුක්ති සහගතව සැක කරනු ලබන— (ඇතුළුවීමේ, සෝදිසි කිරීමේ සහ තහනමට ගැනීමේ බලතල.)

(අ) යම් තැනැත්තකු සිරභාරයට ගත හැකි ය;

(ආ) යම් ස්ථානයකට ඇතුළු වී එය සෝදිසි කළ හැකි ය;

(ඇ) යම් පුද්ගලයකු නැතහොත් යම් වාහනයක්, යාත්‍රාවක්, දුම්රියක් හෝ ගුවන් යානයක් නතර කර සෝදිසි කළ හැකි ය; තවද

(ඈ) යම් ලේඛනයක් හෝ දෙයක් තහනමට ගත හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් හෝ (1) වන උපවගන්තිය යටතේ හෝ තමා වෙත පැවරුණු යම් බලයක් නීත්‍යානුකූලව ක්‍රියාත්මක කරන යම් පොලිස් නිලධරයකුට බාධා කරන හෝ අවහිර කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට අවුරුදු හතකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

7. (1) 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සිරභාරයට ගනු ලැබූ යම් තැනැත්තකු පැය හැත්තෑ දෙකක් නොඉක්මවන කාලසීමාවක් අත්අඩංගුවේ තබාගනු ලැබිය හැකි ය. තවද ඒ තැනැත්තා සම්බන්ධයෙන් 9 වන වගන්තිය යටතේ රඳවා තබා ගැනීමේ නියමයක් කර ඇත්නම් මිස, ඒ කාලසීමාව ඉකුත් වීමට පෙර ඔහු මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, පොලිස් අධිකාරී නිලයට පහළ නොවන නිලයක් දරන පොලිස් නිලධරයකු විසින් තත්කාර්යය සඳහා ලියවිල්ලකින් කරන ලද ඉල්ලීම (රිමාන්ඩ්භාරයේ තැබීමේ ආඥාව.)

මක් මත, ඒ තැනැත්තා පිළිබඳ නඩු විභාගය අවසාන වන තෙක්, ඒ තැනැත්තා, රිමාන්ඩ් භාරයේ තබන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කළ යුතු ය :

එසේ වුව ද නඩු විභාගය අවසාන වීමට පෙර ඒ තැනැත්තා අත්අඩංගුවෙන් මුදාහැරීමට නීතිපතිවරයා එකඟ වූ අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තා අත්අඩංගුවෙන් මුදා හළ යුතු ය.

(2) මේ පනත යටතේ යම් වරදක් කිරීමෙහි ලා සම්බන්ධ හෝ ප්‍රවේදිතාවක් දක්වන හෝ සම්බන්ධ යයි නැතහොත් ප්‍රවේදිතාවක් දක්වන්නේ යයි යුක්ති සහගතව සැක කරනු ලබන යම් තැනැත්තකු (1) වන උපවගන්තියේ සඳහන් ආකාරයෙන් හැර අන් ආකාරයකින් යම් අධිකරණයක් ඉදිරියේ පෙනී සිටි නැතහොත් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, නඩු විභාගය අවසාන වන තෙක් ඒ තැනැත්තා රිමාන්ඩ් භාරයේ තබන ලෙස, ඒ අධිකරණය විසින් ආඥා කළ යුතු ය :

එසේ වුව ද, ඒ තැනැත්තා පැය හැත්තෑ දෙකක් නොඉක්මවන කාලසීමාවක් පොලිස් අත්අඩංගුවේ තබා ගැනීමට පොලිස් අධිකාරී නිලයට පහළ නොවන නිලයක් දරන පොලිස් නිලධරයකුගේ අත්සන යටතේ ඉල්ලීමක් කරනු ලැබුවහොත්, එසේ අත්අඩංගුවේ තබා ගැනීමට මහෙස්ත්‍රාත්වරයා විසින් බලය දිය යුතු අතර එවිට මහෙස්ත්‍රාත්වරයා විසින් කරන ලද රිමාන්ඩ් භාරයේ තැබීමේ ආඥාව, ඒ තැනැත්තා පොලිස් අත්අඩංගුවේ සිටින කාලසීමාව තුළ, අත්හිටුවනු ලැබ පැවතිය යුතු ය.

(3) 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සිරභාරයට ගනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් නැතහොත් මේ වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය හෝ යටතේ රිමාන්ඩ් භාරයේ තබනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන්—

(අ) මේ පනත යටතේ විමර්ශනයක් පවත්වන පොලිස් නිලධරයකුට ඒ තැනැත්තා මුණගැසීමේ අයිතිවාසිකම ද යුක්ති සහගත වේලාවන් තුළ දී, ප්‍රශ්න කිරීමේ කාර්යය සඳහා, ඒ තැනැත්තා යම් ස්ථානයකට ගෙනයාමේ සහ විමර්ශන පැවැත්වීමේ කාර්ය සඳහා එක් ස්ථානයකින් තවත් ස්ථානයකට ගෙනයාමේ අයිතිවාසිකම ද ඇත්තේ ය ; තවද

(ආ) මේ පනත යටතේ විමර්ශනයක් පවත්වන පොලිස් නිලධරයකු විසින් ඒ තැනැත්තාගේ අත්අකුරුවල ආදර්ශයක් ලබා ගැනීම ද ඒ තැනැත්තාගේ ඇඟිලි සලකුණු ලබාගැනීම සඳහා හෝ ඒ තැනැත්තා අන්‍යාකාරයකින් හඳුනාගැනීම සඳහා හෝ යුක්ති සහගතව අවශ්‍ය විය හැකි සියලු ක්‍රියාවන් ද කළ හැකි ය.

**මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රකාශය වාර්තාගත කිරීම.**

8. විමර්ශනයක හෝ නඩු විභාගයක කවර වූ හෝ අවස්ථාවක දී, මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීමට අදාළ යම් සිද්ධියක් පිළිබඳව දැනීමක් ඇති යම් තැනැත්තකු, යම් පොලිස් නිලධරයකු විසින් යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කළ හැකි අතර, එවිට ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාගේ ප්‍රකාශය දිවුරුම් පිට වාර්තාගත කළ යුතු ය.

## III වන කොටස

## රඳවා තැබීමේ සහ සීමා කිරීමේ නියම

රඳවා තැබීමේ නියම.

**9.** (1) යම් තැනැත්තකු යම් නීති විරෝධී ක්‍රියාකාරකමකට සම්බන්ධ බව හෝ ප්‍රවේදිතාවක් දක්වන බව විශ්වාස කිරීමට හෝ සැක කිරීමට අමාත්‍යවරයාට හේතු ඇති අවස්ථාවක, අමාත්‍යවරයා විසින් නිර්ණය කරනු ලබන ස්ථානයක සහ කොන්දේසිවලට යටත්ව, පළමු අවස්ථාවේ දී මාස තුනක් නොඉක්මවන කාලයක් ඒ තැනැත්තා රඳවා තැබීමට අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි අතර, එවැනි යම් නියමයක් වරකට මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා කලින් කල දීර්ඝ කරනු ලැබිය හැකි ය:

එසේ වුවද, එලෙස රඳවා තැබීමේ මුළු කාල සීමාව මාස දහ අටක කාලයක් නො ඉක්මවිය යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් නියමයක් කරනු ලැබීමෙන් පසු යම් අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් ඒ නියමය ක්‍රියාත්මක වීම අත්හිටුවිය යුතු බවට විධානයක් කරනු ලැබිය හැකි අතර 11 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබිය හැකි ය.

(ආ) ඒ විධානය කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද තමා වෙත නියම කරනු ලැබූ යම් කොන්දේසියක් පිළිපැදීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලැබ ඇති බවට හෝ මහජන ආරක්ෂාවට හානියක් නොමැතිව, නියමය ක්‍රියාත්මක වීම අත්හිටුවීම, තව දුරටත් පවත්වාගෙන යා නොහැකි බවට හෝ අමාත්‍යවරයා සෑහීමට පත්වුවහොත් අමාත්‍යවරයා විසින් ඒ විධානය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

9 වන වගන්තිය යටතේ නියමය අවසානාත්මක විය යුතු බව.

**10.** 9 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් අවසානාත්මක විය යුතු අතර රිට් ආඥාවකින් හෝ අන්‍යාකාරයකින් හෝ යම් අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාරයක දී එය ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

ඇතැම් අවස්ථාවලදී ගමන් බිමන් සීමා කිරීම නියම කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.

**11.** (1) 9 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් යම් නීති විරෝධී ක්‍රියාකාරකමක් කිරීමට යම් තැනැත්තකු සම්බන්ධ බව හෝ ප්‍රවේදිතාවක් දක්වන බව විශ්වාස කිරීමට හෝ සැක කිරීමට අමාත්‍යවරයාට හේතු ඇති අවස්ථාවක අමාත්‍යවරයා විසින් ලිඛිත නියමයක් මගින්—

(අ) එහි සඳහන් කරනු ලැබිය හැකි පදිංචි ස්ථානයෙන් බැහැරව ඒ තැනැත්තාගේ ගමන් බිමන්; හෝ

(ආ) ඒ තැනැත්තාගේ පදිංචි ස්ථාන සහ සේවා නියුක්ති ස්ථාන; හෝ

(ඇ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත ඒ තැනැත්තාගේ ගමන්; හෝ

(ඈ) ඒ තැනැත්තා සාමාජිකයකු වුවද නොවුවද යම් සංවිධානයක්, සංගමයක් හෝ පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් ඔහුගේ ක්‍රියාකාරකම්; හෝ

(ඉ) ඒ තැනැත්තා විසින් මහජන රැස්වීම් ඇමතීම හෝ යම් සංවිධානයක, සංගමයක හෝ පුද්ගල මණ්ඩලයක ධුරයක් දැරීම, නැතහොත් කටයුතුවලට සහභාගි වීම නැතහොත් උපදේශකයකු වශයෙන් ක්‍රියා කිරීම හෝ යම් දේශපාලන කටයුතුවලට සහභාගි වීම

සම්බන්ධයෙන් ඒ නියමයෙහි සඳහන් කරනු ලබන යම් තහනම් කිරීම් හෝ සීමා කිරීම් ඒ තැනැත්තා විෂයෙහි පනවනු ලැබිය හැකි ය. තව ද නියමයෙහි සඳහන් බලධරයකුට එහි සඳහන් ආකාරයට හා එහි සඳහන් වේලාවන්හි දී ඒ තැනැත්තාගේ ගමන් බිමන් පිළිබඳව දැනුම් දෙන ලෙස ද අමාත්‍යවරයා විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු සම්බන්ධයෙන් රඳවා තැබීමේ නියමයක් බලාත්මකව තිබෙන අතරතුර අමාත්‍යවරයා විසින් ඒ තැනැත්තා සම්බන්ධයෙන් සීමා කිරීමේ නියමයක් කරනු ලබන අවස්ථාවක, අන්‍යාකාරයකින් සඳහන් කරනු නොලැබුවේ නම්, රඳවා තැබීමේ නියමයේ කාලය අවසන් වූ විට ඒ සීමා කිරීමේ නියමය ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක් ම, එහි සඳහන් කරනු ලැබිය හැකි පරිදි, මාස තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බලාත්මක විය යුතු ය:

එසේ වුවද ඒ කාලසීමාවල එකතුව, මාස දහ අටක් නොඉක්මවන ආකාරයෙන්, වරකට මාස තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා කලින් කල ඒ කාල සීමාව ලිඛිත නියමයකින් අමාත්‍යවරයා විසින් දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබූ අවස්ථාවක, ඒ නියමය අදාළ වන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට භාර දෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින්, ඒ තැනැත්තා විෂයෙහි ඒ නියමයෙන් පනවනු ලැබූ යම් තහනම් කිරීම් හෝ සීමා කිරීම් වෙනස් කිරීම, අවලංගු කිරීම හෝ ඊට එකතු කිරීම හෝ අමාත්‍යවරයා විසින් කළ හැකි අතර, එසේ වෙනස් කරනු ලැබූ හෝ එකතු කරනු ලැබූ තහනම් කිරීම් හෝ සීමා කිරීම්, කලින් අවලංගු කරනු ලැබුවේ නම් මිස, ඒ නියමයෙහි සඳහන් කාල සීමාවේ අවසන් නොවූ කොටස සඳහා හෝ (3) වන උපවගන්තිය යටතේ දීර්ඝ කරනු ලැබූ කාල සීමාව සඳහා හෝ තවදුරටත් බලාත්මක විය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද නියමයක් අවසානාත්මක විය යුතු අතර, රිට් ආඥාවකින් හෝ අන්‍යාකාරයකින් කිසිම අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාරයක දී හෝ එය ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

දණ්ඩනය. 12. 11 වන වගන්තිය යටතේ වූ නියමයකින් නියම කරනු ලැබූ යම් තහනම් කිරීමක් හෝ සීමා කිරීමක් කඩ කරන හෝ උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට අවුරුදු පහක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

## IV වන කොටස

### උපදේශක මණ්ඩලය

13. (1) මේ පනතේ කාර්ය සඳහා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් තුන් දෙනකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත උපදේශක මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය. උපදේශක මණ්ඩලය.

(2) රඳවා තැබීමේ හෝ සීමා කිරීමේ නියමයක් කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට, ඒ නියමය කරනු ලැබුවේ යම් නීති විරෝධී ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් ද ඒ නීති විරෝධී ක්‍රියාකාරකම දන්වනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් වෙන යම් තැනැත්තකු විසින් උපදේශක මණ්ඩලයට කරුණු ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) එවැනි කරුණු ඉදිරිපත් කිරීම සලකා බැලීමට පවත්වනු ලබන උපදේශක මණ්ඩලයේ සෑම රැස්වීමකම මූලාසනය සාමාජිකයන් අතුරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබූ සභාපතිවරයකු විසින් දැරිය යුතු අතර, ඒ කරුණු ඉදිරිපත් කිරීම් සම්බන්ධයෙන් අමාත්‍ය වරයාට උපදෙස් දීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(4) යම් නියමයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන යම් කරුණු ඉදිරිපත් කිරීම් විභාග කිරීමට සහ ඒ පිළිබඳව සුදුස්සක් කිරීමට අදාළ රීති අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි ය.

## V වන කොටස

### ප්‍රකාශන තහනම් කිරීම

14. (1) 1 වන වගන්තිය යටතේ කරන ලද යම් නියමයක් නොතකා, අමාත්‍යවරයා විසින් තත් කාර්යය සඳහා කලින් කල කරනු ලබන්නා වූ ද ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන්නා වූ ද නියමයක් මත පමණක්, ඒ නියමයෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් කාලයක් සඳහා (2) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. ප්‍රකාශන තහනම් කිරීම.

(2) (අ) කිසිම තැනැත්තකු විසින්, නියම බලධරයකුගේ ලියවිල්ලකින් වූ අනුමතයක් නොමැතිව—

(i) මේ පනත යටතේ වරදක් සංයුක්ත වන්නා වූ යම් ක්‍රියාවක් කිරීමට හෝ එවැනි යම් වරදක් විමර්ශනය කිරීමට ; නැතහොත්

(ii) සාහසික ක්‍රියාවලට පෙළඹවීමට හෝ, ආගමික, වර්ගිය හෝ ජාතිවාදී අසංගතිය නැතහොත් විවිධ ජනකොටස් අතර හෝ වර්ගීය හෝ ආගමික කණ්ඩායම් අතර දුර්චේතනික හෝ එදිරිවාදී හැඟීම් ඇති කිරීමට තුඩු දෙන පෙළඹවීම්වලට

අදාළ යම් කාරණයක් යම් ප්‍රවෘත්ති පත්‍රයක මුද්‍රණය කිරීම හෝ පළ කිරීම හෝ කරනු නොලැබිය යුතු ය.

(ආ) කිසිම තැනැත්තකු විසින්, නියම බලධරයකුගේ ලියවිල්ලකින් වූ අනුමතය නොමැතිව (අ) ඡේදය යටතේ මුද්‍රණය කිරීම හා පළකිරීම තහනම් කරනු ලැබ ඇති යම් කරුණක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ හෝ

ශ්‍රී ලංකාවෙන් පිටත මුද්‍රණය කරන ලද්දා වූ හෝ පළකරන ලද්දා වූ යම් ප්‍රවෘත්ති පත්‍රයක් බෙදාහැරීම හෝ බෙදාහැරීම පිළිබඳව සම්බන්ධතාවක් දක්වීම හෝ කරනු නොලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන අතුරෙන් යම් විධිවිධානයක් කඩකරමින් යම් ක්‍රියාවක් කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු පහක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

(4) (අ) යම් තැනැත්තකු මේ වගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක අධිකරණය විසින්, (3) වන උපවගන්තිය යටතේ ඒ වරද සඳහා එය විසින් පනවනු ලැබිය හැකි දඬුවමට අතිරේකව, අධිකරණය විසින් කරනු ලබන ආඥාවෙහි නිශ්චිතව දක්වනු ලබන යම් ප්‍රවෘත්ති පත්‍රයක් ඒ ආඥාවෙහි නිශ්චිතව දක්වනු ලබන යම් කාලයක් සඳහා කිසිම තැනැත්තකු විසින් මුද්‍රණය කිරීම, පළකිරීම හෝ බෙදාහැරීම හෝ මුද්‍රණය කිරීම, පළකිරීම හෝ බෙදාහැරීම පිළිබඳව කවර වූ හෝ ආකාරයක සම්බන්ධතාවක් දැක්වීම හෝ නොකරනු ලැබිය යුතු බවට ද ඒ ප්‍රවෘත්ති පත්‍රය මුද්‍රණය කරන ලද මුද්‍රණාලය කවර වූ හෝ කාර්යයක් සඳහා හෝ එම ආඥාවෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් කාර්යයක් සඳහා හෝ ඒ ආඥාවෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු කාලය තුළ දී පාවිච්චි නොකරනු ලැබිය යුතු බවට ද ආඥා කරනු ලැබිය හැකි ය.

(ආ) මේ වගන්තිය යටතේ යම් වරදක් කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව නඩු කටයුතු පවරනු ලැබ ඇති අවස්ථාවක, එම ප්‍රවෘත්ති පත්‍රය හෝ ප්‍රකාශනය මුද්‍රණය කරන ලද්දේ යයි කියනු ලබන මුද්‍රණාලය, නඩු විභාගය අවසන් වනතුරු, කවර වූ හෝ කාර්යයක් සඳහා හෝ ආඥාවෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් කාර්යයක් සඳහා හෝ පාවිච්චි කරනු නොලැබිය යුතු බවට අතුරු ආඥාවක් කරනු ලැබීමට අධිකරණයට බලය ඇත්තේ ය.

## VI වන කොටස

### නඩු විභාගය

නඩු විභාගය.

**15.** මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තකු ම, ජූරි සභාවක් නොමැතිව, තනිවම විනිශ්චයසනාරූඪ වන මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු ඉදිරියේ වූ අධිචෝදනාවක් මත, මූලික පරීක්ෂණයකින් තොරව, නඩු විභාගයට භාජන කරනු ලැබිය යුතු වන්නේ ය.

16. (1) වෙනත් යම් නීතියක විධිවිධාන නොතකා, මේ පනත යටතේ යම් තැනැත්තකු යම් වරදකට චෝදනා ලැබ ඇති අවස්ථාවක, ඒ තැනැත්තා විසින් යම් වේලාවක දී කරන ලද යම් ප්‍රකාශයක්— ඇතැම් ප්‍රකාශ පිළිබඳ ආවේශ්‍යතාව.

(අ) එය අපරාධෝච්චාරණයක් වන්නේ හෝ නොවන්නේ වුව ද ;

(ආ) වාචිකව කරන ලද්දේ වුව ද නැතහොත් ලියාගන්නා ලද්දේ වුව ද ;

(ඇ) එම තැනැත්තා පොලිස් නිලධරයකුගේ අත් අඩංගුවේ සිටියේ හෝ නොසිටියේ හෝ පොලිස් නිලධරයකු ඉදිරියේ සිටියේ හෝ නොසිටියේ වුව ද ;

(ඈ) විමර්ශනයක දී හෝ නොඑසේව කරන ලද්දේ වුව ද ;

(ඉ) එය යම් ප්‍රශ්නයකට දෙන ලද සම්පූර්ණ පිළිතුරක් හෝ පිළිතුරකින් කොටසක් වුව ද නොවුව ද

එම ප්‍රකාශය සාක්ෂි ආඥාපනතේ 24 වන වගන්තිය යටතේ අදාළ නොවන්නේ නැති නම්, එය එම තැනැත්තාට විරුද්ධව ඔප්පු කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද ඒ ප්‍රකාශය සහකාර පොලිස් අධිකාරිවරයකුගේ තත්ත්වයට පහළ පොලිස් නිලධරයකු වෙත කරන ලද්දේ නම්, එම තැනැත්තාට විරුද්ධව එවැනි කිසිම ප්‍රකාශයක් ඔප්පු කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් ප්‍රකාශයක් සාක්ෂි ආඥාපනතේ 24 වන වගන්තිය යටතේ අදාළ නොවන බව ඔප්පු කිරීමේ භාරය, එය අදාළ නොවන්නේ යයි කියාපාන තැනැත්තා වෙත පැවරෙන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ආවේශ්‍ය වන යම් ප්‍රකාශයක් ඒ ප්‍රකාශය කළ තැනැත්තා සමග එක්ව චූදිත වෙනත් යම් තැනැත්තකුට විරුද්ධව ද ඔප්පු කරනු ලැබිය හැකි අතර, ඒ ප්‍රකාශය එසේ ඔප්පු කළ හැක්කේ (1) වන උපවගන්තියෙහි සඳහන් ප්‍රකාශවලට අමතරව ඒ ප්‍රකාශයෙහි වූ වැදගත් විස්තර වෙනත් සාක්ෂිවලින් තහවුරු වුවහොත් සහ එසේ තහවුරු වුවහොත් ම පමණකි.

17. වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, සාක්ෂි ආඥාපනතේ 25 වන, 26 වන සහ 30 වන වගන්තිවල විධිවිධාන මෙම පනත යටතේ යම් නඩු කටයුත්තක දී අදාළ නොවිය යුතු ය. සාක්ෂි ආඥාපනතේ 25 වන, 26 වන සහ 30 වන වගන්ති අදාළ නො විය යුතු බව.

18. (1) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද— ඇතැම් ප්‍රකාශ සහ ලේඛන ආවේශ්‍ය වන බව.

(අ) මහේස්ත්‍රාත්වරයකු විසින් සටහන් කරගන්නා ලද ප්‍රකාශයක් හෝ මිය ගොස් ඇති තැනැත්තකු විසින් නැතහොත් සොයා ගැනීමට නොහැකි තැනැත්තකු විසින් හඳුනා

හැඳිනීමේ පෙරෙට්ටුවක දී කරන ලද ප්‍රකාශයක්, ඒ තැනැත්තා පැමිණ නොසිටිම හෝ ඒ තැනැත්තාගෙන් හරස් ප්‍රශ්න ඇසීමට නොහැකිවීම හෝ හරස් ප්‍රශ්න අසනු නොලැබ ඇති බව හෝ නොතකා සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු ය ; තව ද

(ආ) මේ පනත යටතේ යම් වරදකට චූදිත තැනැත්තකුගේ හෝ ඒ තැනැත්තාගේ අනුයෝජිතයකුගේ හෝ නියෝජිතයකුගේ හෝ භාරයේ, පාලනය යටතේ හෝ සන්තකයෙහි තිබී සොයා ගන්නා ලද යම් ලේඛනයක්, ඒ තැනැත්තාට එරෙහිව සාක්ෂි වශයෙන් එම ලේඛනය පිළියෙල කරන ලද තැනැත්තා සාක්ෂිකරුවකු වශයෙන් නොකැඳවා ම, අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, ඒ ලේඛනයෙහි ඇතුළත් දේ එහි සඳහන් කරුණු පිළිබඳ වූ සාක්ෂි විය යුතු ය.

(2) යම් සාක්ෂිකරුවකු විසින් කරනු ලැබ මහෙස්ත්‍රාත්වරයකු විසින් සටහන් කරනු ලැබුවා වූ හෝ හඳුනා ගැනීමේ පෙරෙට්ටුවක දී කරනු ලැබුවා වූ ප්‍රකාශයක සඳහන් කරුණු පිළිබඳව, ඒ සාක්ෂිකරු යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් ප්‍රකාශිතව ම හෝ අනිවාර්ය ගම්‍යමානයෙන් හෝ පරස්පර විරෝධී සාක්ෂි දෙනු ලැබුවහොත් විනිශ්චයාසනාරූඪ විනිශ්චයකාරවරයා විසින් මේ පනත යටතේ වූ වරදක් පිළිබඳ නඩු විභාගයක දී—

(අ) ඒ ප්‍රකාශය මත ක්‍රියා කිරීම ; සහ

(ආ) අධිකරණ නඩු කටයුත්තක යම් අවස්ථාවක දී චේතනාන්විත ව බොරු සාක්ෂි දීම පිළිබඳව ඒ නඩු විභාගය අවසානයේ දී ඒ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් පිළියෙල කර අත්සන් කරනු ලැබූ අධිචෝදනාවක් මත, ඒ සාක්ෂිකරු අධිකරණය ඉදිරියට පමුණුවා නඩු විභාග කරනු ලැබීම

නීත්‍යනුකූල විය යුතු ය.

(3) (2) (ආ) වන උපවගන්තියෙහි සඳහන් යම් නඩු විභාගයකදී සාක්ෂිකරු විසින් පරස්පර විරෝධී ප්‍රකාශයක් කළ බව පමණක් ඔප්පු කිරීම ප්‍රමාණවත් විය යුතු අතර, ඒ ප්‍රකාශයන් අතුරින් කවර ප්‍රකාශයක් අසත්‍ය දැයි ඔප්පු කිරීම අවශ්‍ය නොවිය යුතු ය.

යම් ලිඛිත නීතියක ඇප දීම සම්බන්ධයෙන් ඇති විධිවිධාන, මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් චූදිත තැනැත්තන්ට අදාළ නොවිය යුතු බව.

19. වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුවද—

(අ) මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තකු ම, ඔහු වරදකරු කරනු ලැබීමට හෝ ඔහු වෙත පනවනු ලැබූ දඬුවමට එරෙහිව ඔහු විසින් අභියාචන පෙත්සමක් ඉදිරිපත් කර ඇත ද, අභියාචනය තීන්දු කරනු ලබන තෙක්, සිරභාරයේ තබා ගත යුතු ය ;

(ආ) 14 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කරනු ලැබූ යම් ආඥාවකට එරෙහිව යම් අභියාචනයක් කර ඇත ද, ඒ ආඥාව එවැනි අභියාචනයක් තීන්දු කරනු ලබන තෙක්, නොකඩවා බල පැවැත්විය යුතු ය :

එසේ වුවද, අසාමාන්‍ය අවස්ථාවල දී අභියාචනාධිකරණය සුදුසු යයි සලකන කොන්දේසිවලට යටත්ව, (අ) ඡේදයේ සඳහන් යම්කිසි තැනැත්තකු අභියාචනාධිකරණය විසින් ඇප පිට නිදහස් කරනු ලැබීම හෝ (ආ) ඡේදයේ සඳහන් යම් ආඥාවක් වෙනස් කරනු ලැබීම හෝ අත්හිටවනු ලැබීම කළ හැකි ය.

20. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ කුමක් සඳහන් වුව ද— අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඇතැම් විධිවිධාන, මේ පනත යටතේ කළ වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ හෝ වරදකරු වූ තැනැත්තන්ට අදාළ නොවිය යුතු බව.

(අ) මේ පනත යටතේ යම් අධිකරණයක් විසින් හෝ අධිකරණයක් හමුවේ යම් වරදක් සම්බන්ධයෙන්, වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට එකී අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය ;

(ආ) මේ පනත යටතේ යම් අධිකරණයක් විසින් හෝ අධිකරණයක් හමුවේ යම් වරදක් සම්බන්ධයෙන්, වරදකරු බව පිළිගන්නා හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට එකී අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 306 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

21. මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබූ හෝ අධිචෝදනා නගනු ලැබූ යම් තැනැත්තකු පිළිබඳ නඩු විභාගයට සහ එවැනි යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබීම හා එවැනි වරදකරු කරනු ලැබීමක් මත පැන වූ දඬුවමක් පිළිබඳ යම් අභියාචනයක් ඇසීමට සෑම අධිකරණයක් විසින් ම ප්‍රමුඛත්වය දිය යුතු ය. මේ පනත යටතේ ඇති නඩු විභාග සහ අභියාචන සඳහා ප්‍රමුඛත්වය දිය යුතු බව.

## VII වන කොටස

## විශේෂ විධිවිධාන

22. නිශ්චිත තැනැත්තකු සම්බන්ධයෙන් හෝ, මේ පනතේ I වන කොටස ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පසුව සිදු කර තිබුනේ නම් මේ පනත යටතේ වරදක් බවට පත් වන යම් වරදක් පිළිබඳ සාක්ෂිකරුවකු ව සිටි තැනැත්තකු සම්බන්ධයෙන් හෝ, දණ්ඩ නීති සංග්‍රහයේ 296 වන වගන්තිය හෝ 297 වන වගන්තිය හෝ 300 වන වගන්තිය හෝ යටතේ යම් වරදක් සිදු කර ඇති හෝ මේ පනතේ VI වන කොටස ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙර එකී යම් වරදක් සිදු කිරීමට ඒ දිනයට පෙර අනුබල දී ඇති හෝ අනුබල දීමට කුමන්ත්‍රණය කර ඇති හෝ යම් තැනැත්තකු, වෙනත් නීතියක පටහැනිව කුමන විධිවිධානයක් තිබුණ ද ජූරි සභාවක් නොමැතිව, තනිවම විනිශ්චයාසනාරූඪ වන මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු ඉදිරියේ දී, මූලික පරීක්ෂණයකින් තොරව, අධිචෝදනාවක් මත නඩු විභාගයට භාජන කළ යුතු ය. දණ්ඩ නීති සංග්‍රහයේ ඇතැම් වගන්ති යටතේ, නිශ්චිත තැනැත්තන් සම්බන්ධයෙන් වැරදි කරන තැනැත්තන්ට විරුද්ධව මේ පනත යටතේ නඩු විභාග කළ හැකි බව.

ප්‍රකාශවල ආවේශ්‍යතාව.

23. මේ පනතේ I වන, II වන සහ VI වන කොටස් ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පසුව සිදු කරන ලද නම් මේ පනත යටතේ වූ වරදක් සංයුක්ත වන යම් ක්‍රියාවක් මේ පනතේ එකී කොටස් ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙර සිදු කර ඇති අවස්ථාවක, ඒ ක්‍රියාවට සහ ඒ සම්බන්ධයෙන් නැතහොත් යම් ක්‍රියාවක් සම්බන්ධව සිදු කරන ලද යම් වරදක් පිළිබඳ නඩු විභාගයකට සහ ඒ සම්බන්ධයෙන් හෝ, මේ පනතේ 8 වන, 16 වන, 17 වන සහ 18 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය:

එසේ වුව ද එකී යම් වගන්තියක සඳහන් කවර වුව ද ප්‍රකාශයක්, ඒ ප්‍රකාශය මේ පනතේ ඉහත සඳහන් කොටස් ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසුව කරන ලද්දක් නම් මිස, ආවේශ්‍ය නොකළ යුතු ය.

යාත්‍රාවකට හෝ ගුවන් යානයකට අදාළව සිදු කළ ක්‍රියාවක්.

24. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ යම් යාත්‍රාවක දී නැතහොත් ගුවන් යානයක දී හෝ එවැනි යාත්‍රාවකට නැතහොත් ගුවන් යානයකට සම්බන්ධව යම් තැනැත්තකු විසින් සිදු කරනු ලබන යම් ක්‍රියාවක් මේ පනත යටතේ වරදක් වේ නම්, ඒ තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

## VIII වන කොටස

### විවිධ

පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.

25. මේ පනත යටතේ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ විට, ඒ පුද්ගල මණ්ඩලය—

(අ) නීතිගත සංස්ථාවක් නම් ඒ නීතිගත සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු ම සහ නිලධරයකු ම; හෝ

(ආ) වෙළෙඳායතනයක් නම් ඒ වෙළෙඳායතනයේ සෑම හවුල් කරුවකු ම; හෝ

(ඇ) වෙළෙඳායතනයක් නොවන සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් නම් ඒ මණ්ඩලයේ කළමනාකාරිත්වය හා පාලනය සඳහා වග කිවයුතු සෑම නිලධරයකු ම

ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුවද ඒ වරද සිදු කරන ලද්දේ තමාගේ අනුදැනුම ඇතිව නොවන බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තමා නිසි සියලු උද්‍යෝගයෙන් යුතුව ක්‍රියා කළ බව හෝ යට කී යම් තැනැත්තකු විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඒ තැනැත්තා ඒ වරදට වරදකරුවකු ලෙස නොසැලකිය යුතු ය.

නිලධරයන් ආදීන් ට ආරක්ෂාව සැලසීම.

26. මේ පනත යටතේ කරන ලද යම් නියමයක් හෝ දෙන ලද විධානයක් හෝ ප්‍රකාර නැතහොත් එවැනි යම් නියමයක් හෝ විධානයක් අනුව කරන ලදැයි සැලකෙන්නා වූ ද සද්භාවයෙන් කරන ලද නැතහොත් සද්භාවයෙන් කරන ලදැයි සැලකෙන්නා වූ ද යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් යම් නිලධරයකුට

හෝ තැනැත්තකුට විරුද්ධව සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරීම නැතහොත් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් පැවැත්වීම නොකළ යුතු ය.

27. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් මේ පනත යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර, එසේ පළ කරන ලද දිනයෙහි හෝ ඒ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කළ හැකි යම් පසු දිනයක සිට හෝ ඒ නියෝගය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි තාක් ඉක්මණින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරන ලද ලෙස සැලකිය යුතු නමුත් ඒ නියෝගය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් සිදු නොවිය යුතු ය. නියෝගයක් යම් දිනයක සිට පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන්නේ ද ඒ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය.

28. වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය. ඒ අනුව, මේ පනතේ විධිවිධාන සහ වෙනත් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් ගැටීමක් හෝ අනනුකූලත්වයක් ඇති වුවහොත්, මේ පනතේ විධිවිධාන ඒ අනෙක් නීතියේ විධිවිධාන අභිභවා බලපැවැත්විය යුතු ය. මේ පනත වෙනත් ලිඛිත නීතියක් අභිභවා බලපවත්වන බව.

29. මේ පනතේ විධිවිධාන, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වූ දින සිට වර්ෂ තුනක කාලයක් ක්‍රියාත්මක වන්නේ ය. මේ පනත බලපවත්නා කාලසීමාව.

30. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 16 දරන ද්‍රවිඩ ලංකා විමුක්ති කොටි හා වෙනත් සමාන සංවිධාන තහනම් කිරීමේ පනත මෙයින් ඉවත් කරනු ලැබේ. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 16 දරන පනත ඉවත් කිරීම.

## IX වන කොටස

## අර්ථ නිරූපණය

31. (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි,— අර්ථ නිරූපණය.

"නියම බලධරයා" යන්නෙන්, මේ පනතේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් නියම බලධරයකු වශයෙන් නමින් හෝ ධුරයෙන් හෝ පත් කරනු ලබන යම් තැනැත්තෙක් අදහස් වේ;

"සමුපකාර සංගමය හෝ සමුපකාර සමිතිය" යන්නට, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ ලියාපදිංචි කර ඇතැයි සලකනු ලබන යම් සමිතියක් ඇතුළත් වේ;

"ලේඛනය" යන්නට, දණ්ඩ නීති සංග්‍රහයේ දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"පුපුරණ ද්‍රව්‍ය" යන්නට, පුපුරණ ද්‍රව්‍ය පනතේ දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"තුවක්කු" යන්නට, තුවක්කු ආඥාපනතේ දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ;

"ප්‍රවෘත්ති පත්‍රය" යන්නට, යම් සඟරාවක්, වාර සංග්‍රහයක්, පත්‍රිකාවක් හෝ වෙනත් ප්‍රකාශනයක් ඇතුළත් වේ;

"පීඩාකාරී ආයුධය" යන්නට 1966 අංක 18 දරන පීඩාකාරී ආයුධ පනතේ දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"සංවිධානය" යන්නට, යම් ව්‍යාපාරයක්, සමිතියක්, පක්ෂයක්, සංගමයක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ පුද්ගල කණ්ඩායමක් ඇතුළත් වේ;

"මුද්‍රණාලය" යන්නට, මුද්‍රණය, ශිලා මුද්‍රණය හෝ ඡායාරූප ශිල්පය සඳහා හෝ දෘශ්‍යමාන ආකාරයකින් වචන නිරූපණය කිරීමේ හෝ ප්‍රජනනය කිරීමේ වෙනත් ක්‍රමයක් සඳහා පාවිච්චි කළ හැකි යම් යන්ත්‍රෝපකරණයක්, උපකරණයක් හෝ පිරියතක් හෝ ඒ යන්ත්‍රෝපකරණයට, උපකරණයට හෝ පිරියතට හෝ අයත් යම් අච්චු අකුරු කිසිවක් හෝ වෙනත් දෙයක් ඇතුළත් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"නිශ්චිත තැනැත්තා" යන්නෙන්—

(අ) ජනාධිපතිවරයා ;

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ, මහාධිකරණයේ, දිසා අධිකරණයේ, මහෙස්ත්‍රාත් අධිකරණයේ, ප්‍රාථමික අධිකරණයේ හෝ වෙනත් යම් මුල් අවස්ථා අධිකරණයක විනිශ්චයකාරවරයෙක් ;

(ඇ) විදේශ රාජ්‍යයක යම් නියෝජිතයෙක් හෝ නිලධරයෙක් හෝ අන්තර් ආණ්ඩු ස්වභාවයේ වූ අන්තර්ජාතික සංවිධානයක යම් නිලධරයෙක් හෝ වෙනත් අනුයෝජිතයෙක් ;

(ඈ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙක් ;

(ඉ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ හෝ පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද පරීක්ෂණ කොමිෂන් සභාවක යම් සාමාජිකයෙක් ;

(ඊ) ජූරි සභිකයෙක්, නීතිඥවරයෙක් හෝ අධිකරණයේ නිලධරයෙක් ; සහ

(උ) සන්නද්ධ හමුදාවල, පොලිස් හමුදාවේ සහ මහජන සාමය පවත්වා ගැනීම භාර කරනු ලැබ සිටින වෙනත් යම් හමුදාවල යම් සාමාජිකයෙක්

අදහස් වේ; තව ද

"නීති විරෝධී ක්‍රියාකාරකම" යන්නෙන්, මේ පනත යටතේ වූ යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී කවර වූ හෝ යම් ක්‍රමයකින් ගනු ලැබූ යම් ක්‍රියා මාර්ගයක් හෝ කරනු ලැබූ ක්‍රියාවක් වේ ද, ඒ ක්‍රියාමාර්ගය ගනු ලැබුවේ හෝ ඒ ක්‍රියාව කරනු ලැබුවේ මෙම පනතේ සියලු විධිවිධාන හෝ යම් විධිවිධානයක් ක්‍රියාත්මක වීමේ දිනට පෙර හෝ පසුව හෝ වුව ද, ගනු ලැබූ ඒ ක්‍රියා මාර්ගය හෝ කරනු ලැබූ ඒ ක්‍රියාව නැත හොත් මේ පනත සම්මත කිරීමේ දිනට පෙර කරනු ලැබූ යම් ක්‍රියාවක් ඒ දිනට පසුව කරනු ලැබුවේ නම් මෙම පනත යටතේ වූ වරදක් වන්නේ ද, ඒ ක්‍රියාව අදහස් වේ.

(2) මේ පනතේ යෙදී ඇත්තා වූ ද දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථ කථනය කර ඇත්තා වූ සහ මෙහි ඉහතින් අර්ථ කථනය කර නොමැත්තා වූ ද සියලු වචනවලට හා යෙදුම්වලට දණ්ඩ නීති සංග්‍රහයෙහි යම් අර්ථයක් දී ඇත්තේ ද පිළිවෙළින් ඒ වචනවල හා යෙදුම්වල ඒ අර්ථය ම ඇති සේ සැලකිය යුතු ය.